**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**

**பொலிஸ் ஊடகப் பிரிவு**

**POLICE MEDIA DIVISION**

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.11.30 පැය 1420 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/2152 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


## නුවර කොළඹ ප්‍රධාන මාර්ගයේ ගමනාගමනය අවහිරතාවයක් - යක්කල පොලිස් වසම.

දිවයින පුරා පවතින අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් යක්කල පොලිස් වසමේ කොළඹ නුවර ප්‍රධාන මාර්ගයේ යක්කල ආයුර්වේදය අසල පාලමේ මැද කොටස ගිලා බසිමින් පවතින බවට නිරීක්ෂණය වී ඇත. එබැවින් 2025.11.30 වන අද දින දහවල් කාලයේ සිට නැවත දැනුම්දෙන තුරු යක්කල හන්දියේ සිට තිහාරිය හන්දිය දක්වා මාර්ගයේ කොටස තාවකාලිකව වසා තැබීමට කටයුතු කර ඇත.

## විකල්ප මාර්ග.

- **කොළඹ දෙස සිට නුවර දෙසට ගමන් කරන වාහන යක්කල හන්දියෙන් දකුණට හරවා කිරිදිවැල මාර්ගයේ ගමන් කර නෙල්ලිගහමුල හන්දියෙන් වමට හරවා වාරණ මාර්ගයේ තිහාරිය හන්දිය දක්වා පැමිණ නුවර දෙසට ගමන් කිරීමට හැකියාව ඇත.**

- **නුවර දෙස සිට කොළඹ දෙසට ගමන් කරන වාහන තිහාරිය හන්දියෙන් වමට හරවා වාරණ මාර්ගයේ නෙල්ලිගහමුල හන්දිය දක්වා ගමන් කර දකුණට හැරී කිරිදිවැල මාර්ගයේ යක්කල හන්දිය දක්වා පැමිණ කොළඹ දෙසට ගමන් කිරීමට හැකියාව ඇත.**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**